**ශීර්ෂ 256- ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

1. **ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (අ) | ගම්පහ | (ඉ) | කටාන | (එ) | වත්තල | (ක) | බියගම |
| (ආ) | මිනුවන්ගොඩ | (ඊ) | මීගමුව | (ඒ) | මහර | | |
| (ඇ) | දිවුලපිටිය | (උ) | අත්තනගල්ල | (ඔ) | දොම්පෙ | | |
| (ඈ) | මීරිගම | (ඌ) | ජා-ඇල | (ඕ) | කැලණිය | | |

1.1 **විගණන විෂය පථය**

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජූනි 24 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර

පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

--------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

----------------------------

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 770 ක්වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 748 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් රු. මිලියන 22 හෙවත් සියයට 2.92 ක් වී තිබුණි.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 728,672,000 | 723,376,691 | 5,295,309 | 0.73 |
| මූලධන | 41,650,000 | 24,454,811 | 17,195,189 | 41.28 |
| එකතුව | 770,322,000 | 747,831,502 | 22,490,498 | 2.92 |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

------------------------------------------------------------------------------------

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 27 ක් හා දෙපාර්තමේන්තු 19 ක් විසින් පිළිවෙලින් රු.මිලියන 6,096 ක් හා රු.මිලියන 3,163 ක් වශයෙන් එකතුව රු.මිලියන 9,259 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර, එම ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.මිලියන 4,322 ක් හා රු.මිලියන 3,069 ක් වශයෙන් එකතුව රු.මිලියන 7,391 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පිළිවෙලින් රු.මිලියන 1,774 ක් හා රු.මිලියන 94 ක් වශයෙන් එකතුව රු.මිලියන 1,868 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

**2.2 අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම ලැබීම් | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 25601 | 72 | 51 | 53 | 53 | 245 | 229 |

**2.3 අග්‍රිම ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු. මිලියන 307.29 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 618.11ක් විය.

**2.5 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3. ශීර්ෂ 256 - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, සමහර ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| හානි හා පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි. |
| බඩු ලේඛන පොත | මුදල් රෙගුලාසි 454(1) | මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගබඩා භාණ්ඩ සම්බන්ධ ඉන්වෙන්ට්‍රි ලේඛනය 2014 අප්‍රේල් මාසයේ සිට යාවත්කාලීන කර නොතිබුණි. |
| විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | යාවත්කාලීන කර නොතිබුණි. |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි. |
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |

**3.2 විසර්ජන ගිණුම**

**3.2.1 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන**

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයට අදාළව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු ප්‍රතිපාදනවලට අදාළව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තිරසර බිඟු ගම්මාන ව්‍යාපෘතිය වර්ෂ 3 ක කාලයක් තුළ ක්‍රියාත්මක කිරිම සඳහා පෞද්ගලික ආයතනයක් සමග ගිවිසුමකට එළඹ තිබුණි. එම ව්‍යාපෘතිය 2014 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර, ඒ සඳහා පෞද්ගලික ආයතනයට රු.1,031,436 ක් ගෙවා තිබුණි. 2014 වර්ෂය අවසාන වන විට එම ව්‍යාපෘතිය අතහැර තිබුණි.

(ආ) මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.140,000 කට 2011 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු අධිවේගී මහන මැෂින් 5 ක් 2014 වර්ෂය අවසාන වන විටත් බෙදාදී නොතිබුණි.

(ඇ) මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක ගමකට එක වැඩක් යටතේ කිරිකිත්ත බටහිර හා ඇටිකෙහෙල්ගල්ල බටහිර ජල යෝජනාක්‍රම දෙකක් වෙනුවෙන් පිළිවෙලින් රු.892,436 ක් හා රු.834,308 ක් වශයෙන් එකතුව රු.1,726,744 ක් 2012 වර්ෂයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ගෙවා තිබුණද, 2014 වර්ෂය අවසන් වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබා කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණු දොරින් දොරට ගමින් ගමට සංවර්ධන වැඩ සටහනේ අනුමත ව්‍යාපෘති සම්බන්ධයෙන් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් නිකුත් කර තිබූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ 02 වන කොන්දේසිය අනුව එම ව්‍යාපෘති 2014 වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නිම කළ යුතු වුවත්, එකතුව රු.51,918,452 ක් වූ ව්‍යාපෘති 58 ක් 2015 වර්ෂයට අවිච්ඡේද කර තිබුණි. එකතුව රු.23,623,487 ක්වූ ව්‍යාපෘති 14 ක් ගිවිසුම්ගත වී නොතිබුණි.

(ඉ) මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2014 වර්ෂයේ ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන යටතේ ප්‍රතිලාභීන් වෙත බෙදාදීම සඳහා රු.18,076,073 කට මිලදී ගෙන තිබුණු භාණ්ඩ 1208 ක් 2015 පෙබරවාරි මාසය අවසන් වන විටද අදාළ ප්‍රතිලාභීන් වෙත බෙදාදී නොතිබුණි.

(ඊ) මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් විශ්‍රාම වැටුප් සාවද්‍ය ලෙස ගණනය කිරීම නිසා 2014 දෙසැම්බර් 31 දින වන විට පිළිවෙලින් රු.1,014,396 ක් හා රු. 3,511,281 ක් වශයෙන් රු.4,525,677 ක් වැඩිපුර ගෙවා තිබුණි.

( උ) මධ්‍යම රජයේ අරමුදල් මත දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද පළාත් සභා මන්ත්‍රී ව්‍යාපෘති යෝජනා 85 න් එකතුව රු.10,096,836 ක් වූ ව්‍යාපෘති 44 ක් අග්‍රිම නොලැබීම හා කාලය ප්‍රමාණවත් නොවීම නිසා අතහැර තිබුණි.

(ඌ) දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දිස්ත්‍රික් සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ වූ රු.5,629,000 ක්වූ සංවර්ධන ව්‍යාපෘති 12 ක් 2014 වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණ අතර පසුව එම ව්‍යාපෘති අතහැර තිබුණි.

(එ) ගමනැගුම සංවර්ධන වැඩ සටහන යටතේ 2014 වර්ෂය තුළ නිම කළයුතු එකතුව රු.2,216,281 ක් වූ ව්‍යාපෘති 10 ක් 2015 වර්ෂයට අවිච්ඡේද කර තිබුණි.

(ඒ) ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද දොරින් දොරට ගමින් ගමට සංවර්ධන වැඩ සටහනේ 2014 වර්ෂය තුළ වැඩ අවසන් සහ කෙරීගෙන යන ව්‍යාපෘතිවලට අදාළව 2014 දෙසැම්බර් 31 දිනට රු.56,921,607 ක්වූ බිල්පත් 2015 මාර්තු මාසය වන විටද නිරවුල් කර නොතිබුණි.

(ඔ) ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද දොරින් දොරට ගමින් ගමට සංවර්ධන වැඩ සටහන යටතේ 2014 වර්ෂය තුළදී නිමකළ යුතු රු.45,250,000 ක්වූ ව්‍යාපෘති 47 ක් 2015 වර්ෂයට අවිච්ඡේද කර තිබුණි.

(ඕ) ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ස්වයං රැකියා පුහුණු පාඨමාලා 3 ක් පැවැත්වීම සඳහා රු.1,350,000 වැය කර තිබුණි. අදාළ පුහුණුව ලැබූවන් ස්වයං රැකියාවල නියැලීම පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි.

(ක) දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම නිලධාරි වසම් තුනක ස්වයංරැකියා ලාභීන් 09 දෙනෙකු වෙත එකතුව රු.73,155 ක් වටිනා උපකරණ බෙදා දි තිබුණි. 2015 ජුනි මාසයේදී සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේදී ස්වයංරැකියාලාභීන් 08 දෙනෙකු විසින් එම උපකරණ උපයෝගී කරගෙන අදාළ ස්වයංරැකියා ආරම්භ කර නොතිබුණු බව නිරික්ෂණය විය.

(ග) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දොරින් දොරට ගමින් ගමට වැඩ සටහන යටතේ දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේදී මිලදී ගෙන තිබූ

රු.12,039,629 ක්වූ විවිධ භාණ්ඩ හා උපකරණ 1,760 ක් 2015 ජුනි 05 දින වන විටද අදාළ ප්‍රතිලාභීන් වෙත බෙදා දී නොතිබුණි.

**3.3 පොදු තැන්පත් ගිණුම**

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු.12,863,332 ක්වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අදාළ ප්‍රතිලාභීන් පිළිබඳ විස්තර අනාවරණය කර ගෙන නොතිබුණු රු.7,816,710 ක්වූ ඉඩම් වන්දි මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 කට අදාළ වර්ෂ 10 ක් ඉක්මවූ එකතුව රු.8,832,270 ක ඉඩම් තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(2) පරිදි කටයුතු කර නොතිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**------------------------------------------------------------------**

විෂය අංක 25601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 8 ක වැඩ තහනම් කළ නිලධාරීන් 20 දෙනෙකුගෙන් 2014 දෙසැම්බර් 31 දින වන විට රු.2,206,524 ක්වූ ශේෂ හිගහිටව පැවැතුණි. එම නිලධාරීන් අතරින් නිලධාරින් 13 දෙනෙකුගේ හිගහිටි රු.1,264,437 ක් වූ ණය ශේෂ වර්ෂ 1 සිට වර්ෂ 18 දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි.

(ආ) මියගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 5 දෙනෙකුගෙන් රු.358,522 ක ණය ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක දක්වා කාල පරාසයක සිට අය නොවී පැවැත එමින් තිබුණි.

(ඇ) සේවය හැරගිය නිලධාරීන්ගෙන් වර්ෂ 1 ක සිට වර්ෂ 7 ක් දක්වා කාල පරාසයක සිට රු.405,776 ක් ණය ශේෂ හිඟහිටව පැවැත එමින් තිබුණි.

**3.5 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**3.5.2 විගණන හා කළමනාකරණ කමිටුව**

2014 වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටුවේ එක් රැස්වීම් වාරයක් පමණක් පවත්වා තිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

**බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | වත්කම් වර්ගය | වත්කම් සංඛ්‍යාව/ ඒකක ගණන | වත්කම් ලබාදී ඇති ආයතනය |
|---|---|---|---|
| (i) | නිල නිවාස ගොඩනැගිලි | 01 | ජාතික තරුණ සේවා සභාව, උඩුගම්පොළ |
| (ii) | එම | 01 | සමෘද්ධි බැංකුව, හොරම්පැල්ල |

(iii) මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ උන්නාරුව පිහිටි නිල නිවසක අනවසරයෙන් පවුලක් පදිංචිව සිටීම.

**3.7 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

2013 ඔක්තෝබර් 03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ 13(II) ඡේදය ප්‍රකාරව වත්තල සහ ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක් ඉදිකිරිම සඳහා 2014 වර්ෂයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන මූලික වැඩ ආරම්භ කළ යුතුව තිබුණි. කෙසේ වුවද, එම ඉදිකිරීම් සඳහා 2014 වර්ෂයේදී

රු.28,000,000 ක්වූ ප්‍රතිපාදන සළසා තිබුණත්, ඉන් සියයට 61 කට සමාන රු.17,097,320 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

## 3.8 කළමනාකරණ දුර්වලතා

2007 ජූනි 28 දිනැති අංක 1/8/18 දරන ගම්පහ දිස්ත්‍රික් ලේකම්ගේ ලිපිය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් වසම්වලට අයත් එක් එක් ග්‍රාම නිලධාරී කාර්යාලයක් වර්ෂයකට සිව් වතාවක් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් පරීක්ෂා කළ යුතු වුවත්, සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලට අනුව අදාළ පරිදි පරීක්ෂාව සිදු කර නොතිබුණි.

## 3.9 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 46 | 39 | 7 | - |
| (ii) | තෘතියික මට්ටම | 30 | 22 | 8 | - |
| (iii) | ද්විතියික මට්ටම | 2,060 | 1,939 | 121 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 106 | 103 | 5 | 2 |
| | **එකතුව** | **2,242** | **2,103** | **141** | **2** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 141 ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත්වී තිබුණි.